## මහජන පුස්තකාලයේ නීති හා රෙගුලාසි

### <u>පුස්තකාලය විවෘතකර තැබීම</u>

ඉරිදා දින, රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින හැර සතියේ සෑම දිනකම පෙ.ව. 8.00 - 5.00 දක්වා විවෘත වේ. පුවත්පත් අංශය පමණක් රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින හැර සතියේ සෑම දිනකම විවෘත වේ.

### <u>පුස්තකාල සාමාජිකත්වය</u>

- රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි.
- වසර 2කට වරක් අලුත්කිරීම කළ යුතුයි.
- වැඩිහිටි සාමාජික අයදුම්පත් ගාස්තු රුපියල් 25.00 ක් වන අතර ළමා සාමාජික අයදුම්පත් ගාස්තු රුපියල් 10.00 ක් වේ. වැඩිහිටි සාමාජිකත්වය සඳහා රුපියල් 100.00 ක මුදලක් ද ළමා සාමාජිකත්වය සඳහා රුපියල් 10.00 ක මුදලක් ද සාමාජික ගාස්තු වශයෙන් අය කෙරේ.

### <u>භාරදීම ප්‍රමාද වී ඇති පොත්</u>

මේ සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියා කළයුතු වේ.

- පළමු ප්‍රමාද දින 14-21 කාලය තුළ පළමු දැනුම්දීම (පොත් භාරදෙන ලෙසට) සිදුකිරීම.
- පළමු දැනුම්දීම සිදුකර දින 14-21 කාලය තුළ දෙවන දැනුම්දීම සිදුකිරීම.
- දෙවන දැනුම්දීම සිදුකර දින 07-14 තුළ පාඨකයා වෙත සහ ඇපකරු වෙත අවසාන දැනුම්දීම සිදුකිරීම.
- අවසාන දැනුම්දීමෙන් පසු ද පොත/පොත් භාරදීම සිදුකර නොමැති පාඨකයන්/ඇපකරුවන් සඳහා සමථ මණ්ඩලය ඉදිරියේ නඩු පැවරීමට ක්‍රියා කිරීම.